**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2018**

**-----------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී.ල.ගි.ප්‍ර.16 | | |
| (අ) මණ්ඩලය විසින් තවදුරටත් උපයෝජනය කරනු ලැබූ පිරිවැය රු.147,695,903 ක් වූ අගය ශුන්‍ය වූ ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය පුරෝකථනය කර පොත්වලට ගැනීමට හෝ ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. චක්‍රලේඛ පරිදි අභ්‍යන්තර කමිටුව පත්කිරීමෙන් පසුව ඉදිරි වර්ෂයේ සිට සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් පිළියෙල කළ යුතු බව. |
| (ආ) ප්‍රමිතයේ 34 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉඩම් ගොඩනැගිලි 2010 දෙසැම්බර් 31 දිනෙන් පසුවද, යන්ත්‍ර සූත්‍ර 2012 දෙසැම්බර් 31 දිනයෙන් පසුවද ප්‍රත්‍යාගණනය කර වර්තමාන වටිනාකමට දක්වා නොතිබුණි. | එකඟ වේ. 2019 මැයි 30 දින තක්සේරු වාර්තා ලැබී ඇත. 2019 ගිණුම් වර්ෂයේ දී සටහන් කිරීමට නියමිතය. | එම |
| (ඇ) ප්‍රමිතයේ 37 වන ඡේදය ප්‍රකාරව එක සමාන ස්වරූපයේ වත්කම් එක් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය කල යුතු වුවද, චිත්‍රාගාරය, ත්‍රීවීල් හා ජංගම දූරකථන පිළිවෙලින් ගොඩනැගිලි, වාහන හා කාර්යාල උපකරණ යටතේ පෙන්නුම් කරනු වෙනුවට වෙන වෙනම අයිතම් යටතේ පෙන්නුම් කර තිබුණි. | එකඟ වේ. නිවැරදි කිරීමට නියමිතය. | එම |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 සැප්තැම්බර් 13 දින රු.5,565,000 කට මිලදී ගන්නා ලද ඩබල් කෑ කැබ් රථය මණ්ඩලය නමින් ලියාපදිංචි කර නොතිබූ අතර ප්‍රචාරණ රථයක් ලෙස වැඩි **දියුණු කිරීම සඳහා බාහිර පාර්ශ්වයක් වෙත ලබාදී තිබුණි. එබැවින් එහි වටිනාකම කෙරීගෙන** යන වැඩ යටතේ ගිණුම්වල ගැලපිය යුතුව පැවතියද, ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි. තවද මේ සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රු.376,016 ක් ක්ෂය වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.5,565,000 ක් අඩුවෙන් හා ක්ෂය වියදම රු.376,016 ක් වැඩියෙන් අවසාන ගිණුම්වල පෙන්නුම් කර තිබුණි. | එකඟ වේ. 2019 වසරේ මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි වර්ගීකරණය යටතේ ගිණුම් තැබිය යුතු බව. |
| (ආ) විධිවිධාන ප්‍රකාරව ලොතරැයි දිනුම් ඇදීමේ දින සිට මාස 6 ඉක්මවූ පසුද හිමිකම් නොපෑ ත්‍යාග සඳහා ප්‍රතිපාදන සලසා නොතිබිය යුතු වුවද 2018 පෙබරවාරි 28 දින පවත්වන ලද ශනිදා වාසනා විශේෂ දිනුම් ඇදීමේ වාරයට අදාලව හිමිකම් නොපෑ රු.2,549,000 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයට තවදුරටත් නොදිනූ ත්‍යාග ගෙවිය යුතු ගිණුමේ ඉදිරියට ගෙනවිත් තිබුණි. | එකඟ වේ. 2019 පෙබරවාරි මස පොදු ලෙජරය මඟින් නිවැරදි කර ඇත. | විධිවිධාන ප්‍රකාරව ගිණුම්වල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු බව. |
| (ඇ) 2018 නොවැම්බර් 01 දින රු.ලක්ෂ 45 කට මිලදී ගෙන තිබූ යන්ත්‍ර සූත්‍ර වටිනාකම යන්ත්‍ර සූත්‍ර යටතේ වර්ගීකරණය නොකර කාර්යාල උපකරණ යටතේ වර්ගීකරණය කිරීම හේතුවෙන් ක්ෂය ප්‍රතිශතයේ වෙනස්වීම මත 2018 වර්ෂයේ ක්ෂය වියදම රු.94,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | එකඟ වේ. මෙම වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වර්ගීකරණය යටතේ ගිණුම්ගතකර අවශ්‍ය ගැළපීම් සිදුකළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් අනුව කෙරීගෙන යන වැඩ ලෙස දක්වා ඇති වටිනාකම වූ රු.1,583,595 ක් 2014 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් වන අතර එය අත්හිටුවන ලද ඉදිකිරීම් සඳහා දරන මූලික වියදම් විය. එම වටිනාකම සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුනොකර වසර 04 ක් තිස්සේ තවදුරටත් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | මේ පිළිබඳව අල්ලස් හා දූෂණ කොමිෂමට ලැබුණු පැමිණිල්ලකට අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලිපිගොනු ගෙන්වා පරීක්ෂා කොට ප්‍රකාශ ලබාගෙන ඇත. | අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවෙන් විමසා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් සිදුකළ යුතු වීම. |
| (ඉ) | ලොතරැයි දෙකට අදාලව ගෙවිය යුතු නොදිනූ ත්‍යාග ගිණුම්වල පැවති ශේෂයන් හා තත්‍ය වශයෙන් පැවතිය යුතු ශේෂයන් අතර වූ එකතුව රු.3,379,690 ක වෙනස්කම සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | එකඟ වේ. 2019 පෙබරවාරි මස පොදු ලෙජරය මඟින් නිවැරදි කර ඇත. | ලෙජර් ගිණුම්වල නිවැරදි ශේෂයක් නිරූපනය කළ යුතු බව |
| (ඊ) | මණ්ඩලයේ 2017 වර්ෂයට අදාළ ආදායම් බදු ගණනයේදී මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබූ රු.26,987,404 ක දළ පොළී ආදායම ශුද්ධ පොළී ආදායම ලෙස සලකා ගැලපීම් කර තිබීම නිසා එම වර්ෂයේ පොළී ආදායම රු.2,998,601 කින් වැඩිපුර දක්වා තිබුණි.ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ බදු වියදමද රු.839,608 කින් වැඩිපුර දක්වා තිබුණි. | අවසන් බදු මුදල ගෙවීමේදී රඳවාගැනීමේ බදු ලෙස ප්‍රේෂණය කරන ලද ප්‍රමාණය අඩු කරනු ලැබේ. | ආදායම් බදු ගණනය කිරීමේදී නිවැරදි පොලී ආදායම මත ගණනය කිරීම් සිදුකර ගිණුම්ගත කළ යුතු වීම. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

---------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,467,671ක් වූ වියදම් ගිණුම්ශේෂ 07 ක්සම්බන්ධයෙන් අදාළ තහවුරු කිරීමේ සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| | <u>විෂයය</u> | <u>මුදල</u><br><u>රු.</u> | <u>නොසැපයූ විගණන සාක්ෂි</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|---|---|---|
| (i) | අලෙවි නියෝජිත රැස්වීම් සඳහා වෙන්කල වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම. | 196,955 | ඉන්ධන බිල් පත්‍ර වලට අදාළ වාහන අංකය හා දිනය. | ඉන්ධන බිල්පත්වල වාහන අංකයන් හා දිනයන් ඉදිරියේදී නිවැරදිව ඇතුලත් කරනු ලැබේ. | ලිපි ලේඛන විධිමත්ව පවත්වා ගත යුතු බව |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | කුලී පදනම මත වාහන ලබාගැනීම වෙනුවෙන් ගෙවීම. | 1,794,195 | ධාවනය පිළිබඳව මාසික වාර්තා හා වාහන කුලියට ලබාගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ විශේෂ අනුමැතිය. | වාහන ධාවන පිළිබඳ මාසික වාර්තා ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | විධිවිධාන ප්‍රකාරව ලිපිලේඛන හා පොත්පත් විධිමත්ව පවත්වාගත යුතු බව |
| (iii) | සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ට වෙන්කල වාහන සඳහා ඉන්ධන ලබාගැනීම. | 1,194,648 | මණ්ඩලය විසින් විශේෂ අනුමැතිය ඉල්ලා යැවූ ලිපිය, ජනාධිපති කාර්යාලයෙන් ලබාගත් විශේෂ අනුමැතිය හා භාණ්ඩාගාරයේ විශේෂ අනුමැතිය ලබාගත් ලිපිය | අදාළ ලිපිවල පිටපත් මේ වන විට යවා ඇත | විධිමත් පරිදි අනුමැතිය ලබාගත යුතු බව |
| (iv) | Lottery Shops 31 ක් සන්නාම (Branding) කිරීම. | 1,368,860 | කොන්ත්‍රාත්කරු සමඟ අදාළ කාර්ය සම්බන්ධව ගිවිසුමකට එළඹීමකට කටයුතු කර නොතිබුණි. | ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. කොන්ත්‍රාත්කරුට තහවුරු කිරීමක් ලබාදී ඇති හෙයින් එමඟින් ගිවිසුමක් නිර්මාණය වී ඇත. | විධිමත් ලිඛිත ගිවිසුම් අත්සන් කල යුතු බව |
| (v) | ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික රැස්වීම් | 552,257 | වර්ෂය තුල පවත්වා තිබුණු රැස්වීම් ගණන, රැස්වීම් පැවැත්වීමේ අරමුණු හා රැස්වීම් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | ක්ෂේත්‍ර නිලධාරීන් කාර්යාලයට පැමිණෙන දිනවලදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ඇඟිලි සලකුණ තැබීමට උපදෙස් දී ඇත. රැස්වීමට පැමිණෙන නිලධාරීන්ට අත්සන් තැබීමට ලේඛනයක් ඉදිරියේදී හඳුන්වාදීමට කටයුතු කරනු ලැබේ. | මෙම රැස්වීම් සඳහා සැලකිය යුතු පිරිවැයක් දරන බැවින් නිලධාරීන්ගේ පැමිණීම විධිමත් පරිදි වාර්තා කරගත යුතු බව |
| (vi) | අලෙවි ප්‍රවර්ධන අයිතම | 3,142,044 | බෙදාහැරීමේ ලැයිස්තු හා ප්‍රවර්ධන අයිතම භාරගත් බවට සාක්ෂි | අලෙවි ප්‍රවර්ධන අයිතම් භාරගත් බවට ලේඛන මේ සමඟ යාකර ඇත. | එවැනි ලේඛන යාකර නොතිබූ අතර, විධිමත් පරිදි අදාල ලැයිස්තු පවත්වාගත යුතු බව |
| (vii) | ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉන්ධන දීමනා | 1,218,712 | ධාවන සටහන්, ලොග් සටහන් පොත් හා ලීටරයකින් කි.මී.35 ක් ධාවනය කල හැකි බව තීරණය කිරීමේදී | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ධාවන සටහන් හා ලොග් සටහන් පොත් 2019 අප්‍රේල් මස මුල සිට අනිවාර්ය කොට ඇත. | ඉන්ධන දීමනා ලබාගන්නා ක්ෂේත්‍ර නිලධාරීන් එම ඉන්ධන |

| | | |
|---|---|---|
| සලකා බැලූ කරුණු | එසේ පවත්වා නොමැති අවස්ථාවලදී ඔහුගේ ඉන්ධන දීමනාව අත්හිටුවනු ලැබේ. | යොදාගත් ආකාරය තහවුරු කල හැකි පරිදි සාක්ෂි පවත්වා ගත යුතු වීම. |

**9,467,671**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විධිමත් ලෙස සම්පූර්ණ වූ පසුව ඉතා කඩිනමින් විගණනය වෙත ලබාදෙන ලෙස 2016 වර්ෂයේ සිට විගණන විමසුම් හා තොරතුරු ඉල්ලීම් ලිපි ගණනාවකින් ඉල්ලා තිබුණද අදාල තොරතුරු විධිමත් ලෙස සම්පූර්ණ වූ පසුව කඩිනමින් විගණනය සඳහා ලබාදීමට කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. එසේම එම කාලපරිච්ඡේදය තුල පැවති විගණන කමිටු රැස්වීම්වලදී ද මෙම තත්ත්වය නිවැරදි කරගන්නා බවට එකඟවී තිබුණද ගනුදෙනු ක්‍රියාත්මක කර අවසන් වූ පසුව හා මාස 02 ත් 04 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව එම වාර්තා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. මේ නිසා මෙම වාර්තාවේ පෙන්වාදී ඇති ඇතැම් අලාභ හා අවදානම් අවම කර ගැනීමට මණ්ඩලයට තිබූ අවස්ථා අහිමි වී ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය. | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා තීරණ මීලඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සම්මත වූ පසු ලබාදෙන අතර, අලෙවිකරණයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා තීරණ පමණක් ඒවා ක්‍රියාත්මක කල පසු ලබාදීමට කටයුතු කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා තීරණ විධිමත් ලෙස සම්පූර්ණ කර කාල ප්‍රමාදයකින් තොරව විගණනයට ලබාදීමට කටයුතු කළ යුතු බව. |

**1.6 ලැබිය යුතු ගිණුම්**

---------------------

**1.6.1 ලැබිය යුතු මුදල්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීම සඳහා එළඹුනු ගිවිසුම, ඒක පාර්ශ්විකව මණ්ඩලය විසින් කඩ කිරීම නිසා මණ්ඩලයට අයවිය යුතු රු.5,700,000 ක මුදල වසර 15 ක් තිස්සේ අයකර ගත නොහැකි වී තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් මෙය ගිණුම්වලින් කපා හැරීමට අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා ඇත. | දීර්ඝ කාලීනව අයවිය යුතු මුදල් අයකර ගැනීම හෝ ඒවා විධිමත් පරිදි නිරවුල් කල යුතු බව |

| | | |
|---|---|---|
| (ආ) මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී ගෙවීමේ පදනම මත නිලධාරීන්ට ලබාදී තිබූ මෝටර් සයිකල් සඳහා වසර 06 ක් ගතවී තිබුණද ඒ සඳහා අයවිය යුතු රු.192,817 ක මුදලක් සහ වසර 1 ත් 6 ත් අතර කාලයක් තිස්සේ අලෙවි කුටි ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබූ රු.551,248 ක මුදලක්ද වශයෙන් එකතුව රු.744,065 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.584,065 ක මුදලක් අයකර ගැනීමට නොහැකි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය කපා හැරීමට තීරණය කර ඇති නිසා ඉදිරියේ දී ගිණුම්වලින් ඉවත් කරනු ලැබේ. රු.100,000 ක මුදලක් තවදුරටත් අයකරගත යුතුව ඇත. | දීර්ඝ කාලීනව අයවිය යුතු මුදල් අයකර ගැනීම හෝ ඒවා විධිමත් පරිදි නිරවුල් කල යුතු බව |

## 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17 (5) වගන්තිය | හිමිකම් නොපෑ මුදල් ත්‍යාග ලෙස රු.44,733,538 ක මුදලක්ද, හිමිකම් නොපෑ මූල්‍යමය නොවන ත්‍යාග ලෙස වටිනාකම රු.24,948,808 ක්ද ලෙස එකතුව රු.69,682,346 ක මුදලක් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | විශේෂ ලොතරැයි දිනුම් ඇදීම්වලදී හිමිකම් නොපෑ මුදල් ත්‍යාග හා අයිතම්වල මූල්‍යමය වටිනාකමට මාස 6 ඉකුත් වූ පසු නැවත විශේෂ ප්‍රවර්ධන ලොතරැයි සඳහා භාවිතා කරනු ලැබේ. | පනතේ අරමුණු අනුව ක්‍රියාකල යුතු බව. |
| **(ආ)** **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) 3 ඡේදය | විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර වාහන 02 ක් රු.5,500,000 කට අපහරණය කර තිබුණි. තවද, 2018 වර්ෂය තුල වසර 10 ඉක්මවූ වාහන 6 ක් තාක්ෂණ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව අළුත්වැඩියා කර තිබුණු අතර ඒ සඳහා දරන ලද වියදම රු.1,612,602 ක් විය. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | පවත්නා නීතිරීති චක්‍රලේඛවලට අනුගතව කටයුතු කල යුතු වීම. |
| (ii) 12 ඡේදය | වාහන අපහරණය සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර එහි පිටපතක්, විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | පවත්නා නීතිරීති චක්‍රලේඛවලට අනුගතව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** (VIII) පරිච්ඡේදයේ4.1ඡේදය | - ක්ෂේත්‍ර නිලධාරීන්ට අතිකාල ගෙවීම් සඳහා හිමිකමක් නොමැති වුවද මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් හට සමාලෝචිත වර්ෂයේදී රු.1,337,265 ක් වූ අතිකාල දීමනා ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත ක්ෂේත්‍ර නිලධාරීන්ට ගෙවීමට සිදුවී ඇත. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු බව |
| | - මාණ්ඩලික නිලධාරීන්ට 1/20 දීමනාව ලබාගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දිනකට පැය 08 ක් අනිවාර්යෙන්ම රාජකාරී කල යුතු විය. එහෙත් මණ්ඩලය විසින් මෙම විධිවිධාන නොසලකා නිවාඩු දිනවල මාණ්ඩලික නිලධාරීන් වැඩකල පැය ගණන මත පැයට පැය එකහමාරක් බැගින් අනුපාතිකව අතිකාල දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. තවද එම දිනවලදීම මාණ්ඩලික නිලධාරීන් දිනුම් ඇදීමේ කාර්යය සඳහා සහභාගී වී එම දීමනාවද ලබාගෙන තිබුණි. | 2019 මැයි 21 දිනැති DLB/ADM/02 නැමැති චක්‍රලේඛය ප්‍රකාරව මාණ්ඩලික නිලධාරීන් සෙනසුරාදා, ඉරිදා හා නිවාඩු දිනවල රාජකාරි නිරතවීමේදී අවම වශයෙන් පැය 04 ක් වැඩ කළ යුතු බව හා ඒ අනුව ගෙවීම් සිදුකල බව. | ආයතන සංග්‍රහයට අනුව කටයුතු කල යුතු බව |
| | - ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසලකා පැයකට අඩු කාල කොටස් එකතුකර අතිකාල දීමනා ගෙවා තිබුණි. | ආයතනයේ සේවා අවශ්‍යතාවය මත අතිකාල ගෙවීම් සිදුකර ඇති අතර අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වේ. | ආයතන සංග්‍රහයට අනුව කටයුතු කල යුතු බව |
| **(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 103 හා 103 (1) ඊ | - එක් වාහනයක් අවස්ථා 3 කදී අනතුරුවලට ලක්වී තිබියදී ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමකින් තොරව මණ්ඩලය විසින් රු.129,200 ක් වැය කර එම වාහනය අළුත්වැඩියා කර තිබුණි. | අනතුරට සෘජුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති බව සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | - 2018 මාර්තු 05 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2018 ජූලි 07 දින ස්ථිර කරන ලද රියදුරකුගෙන් 2018 අප්‍රේල් සිට දෙසැම්බර් මස දක්වා කාලය තුල වාහන 04 කට අනතුරු 05 ක් සිදුවී තිබුණි. එම සියළු අනතුරු අපරික්ෂාකාරී ලෙස රිය ධාවනය කිරීම හේතුවෙන් සිදුවී ඇති බව වාර්තා වී තිබියදීත් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනතුරට සෘජුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභහානි අයකර ගන්නා බව සහ රියදුරු වෙත අවවාද ලිපියක් නිකුත් කර ඇති බව. ස්වභාවික හේතූන් මත සිදුවූ අනතුරු සඳහා පොලිස් වාර්තා ලබාදීම පොලිස් ස්ථානවලින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල හානිය සම්බන්ධව ක්‍රියා කල යුතුය. |
| | (ii) | මුදල් රෙගුලාසි757 (2) | - භාණ්ඩ සමීක්ෂණයක් සිදුකලද විධිමත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂණ වාර්තාව 2019 මැයි 30 දින රජයේ විගණන අංශයට භාරදී ඇත. | විධිමත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් ඉදිරිපත් කල යුතු අතර, මුදල් රෙගුලාසි අනුව ක්‍රියාකල යුතු වීම හා වත්කම් නිසි පරිදි කළමනාකරණ කල යුතු බව. |
| **(ඉ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | | |
| | (i) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරන මුදල් අමාත්‍යාංශය චක්‍රලේඛයේ 2 වන ඡේදය | වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව පිළියෙල කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | එකඟ වේ. 2019 වර්ෂයේ සිට වාර්ෂික වැඩසටහන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතු වීම. |
| | (ii) | 2016 ජුනි 17 දිනැති අංක 2016/06 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | රු.මිලියන 200 හෝ 500 ට අඩු ප්‍රසම්පාදන පිරිවැය ඇස්තමේන්තු වෙනුවෙන් ආපසු නොගෙවන තැන්පතුව අවම රු.35,000 ත් උපරිම රු.60,000 ත් අතර අගයක් විය යුතු නමුත්, රු.මිලියන 464 ක් වූ ප්‍රචාරණ නියෝජිත ආයතන | චක්‍රලේඛ අංක 2016/06 විධිවිධාන අනුව මින් ඉදිරියට රඳවා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව මණ්ඩලය එක් ආයතනයකින් රු.5000 ක ආපසු නොගෙවන තැන්පතු මුදලක් පමණක් ලබාගෙන තිබුණි. | | |
| (ඊ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (i) ඡේදය හා 2017 ඔක්තෝබර් 09 දිනැති අංක 2017/10/1184 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වයස අවුරුදු 60 ඉක්මවූ විශ්‍රාමික නිලධාරියකු 2017 ඔක්තෝබර් 09 දින සිට 2019 අප්‍රේල් 14 දින දක්වා කාලය තුල කොන්ත්‍රාත් පදනම මත උපදේශකයකු ලෙස සේවයේ යොදවා තිබුණි. ඒ අනුව මාසිකව රු.100,000 ක දීමනාවක් සමඟ වෛද්‍යාධාර හා ප්‍රවාහන දීමනා ලෙස 2017 ඔක්තෝබර් 09 දින සිට 2019 මාර්තු 31 දින දක්වා රු.2,151,054 ක් ගෙවීම් කර තිබුණි. | එකඟ වේ. අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකර තිබුණද මෙතෙක් අනුමැතිය ලැබී නැති බවත්, වර්තමානයේ සේවය දීර්ඝ කිරීමක් කර නොමැත. වර්තමානයේ එම සේවකයාගේ සේවය අවසන් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (උ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය(ii) ඡේදය | මෙම චක්‍රලේඛයේ නියමයන්ට අනුකූල නොවී, මණ්ඩලයේ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී තනතුර සඳහා මාසික දීමනාව රු.50,000 ක් ද ඉන්ධන දීමනා ලෙස රු.35,000 ක් ද ගෙවීමේ පදනම මත 2019 පෙබරවාරි 01 දින සිට වයස අවුරුදු 70 ක් වූ නිලධාරියකු බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මෙම තනතුර අනුමත කර ඇති බැවින් මෙම බඳවා ගැනීම සිදුකර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**1.8** **තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් ලොතරැයි දිනුම් ඇදීම සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංග සේවාව අවිධිමත් ලෙස පෞද්ගලික සමාගමකින් ලබාගත් එකක් විය. එම මෘදුකාංග මඟින් ලොතරැයි දිනුම් ඇදීමේ දත්ත ප්‍රවේශය මුළුමනින්ම අදාළ සමාගම වෙත පැවරීම හේතුවෙන් මණ්ඩලයේ ප්‍රධානතම කර්තව්‍ය අවදානම් තත්ත්වයකට පත්වීම පිළිබඳ මණ්ඩලයේ ඉහළ කළමනාකරණය අවධානය යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. මෙම පරිගණක හා මෘදුකාංග නඩත්තු කිරීම හා ඒ සම්බන්ධ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණ රු.11,995,200 ක මුදලක්ද ඇතුළුව 2009 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා රු.117,410,057 ක් එම සමාගමට ගෙවා තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ පද්ධතිය සහ එහි දත්තවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කරනු ලැබේ. ඉදිරියේදී පද්ධතිය මණ්ඩලය සතු කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට කටයුතු කරනු ඇති බව. | දිනුම් ඇදීමේ හා ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,187,603,956 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.507,036,703 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,680,567,253 හෙවත් සියයට 331 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභයෙන් හිඟ ආදායම් බදු ඇතුළුව රු.1,819,191,890 ක නැතහොත් සියයට 78 ක බදු වියදමක් දැරීමත්, එය සමාලෝචිත වර්ෂයේදී රු.553,166,576 ක් හෙවත් සියයට 20 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

---

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | ආදායම/වියදම | 2018 | 2017 | වැඩිවීම/අඩුවීම. | ප්‍රතිශතය |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | රු. | රු. | සියයට |
| i. | ටිකට්පත් ආදායම් | 15,854,856,246 | 13,981,500,306 | 1,873,355,940 | 13.4 |
| ii. | වෙනත් ආදායම් | 201,525,679 | 130,891,204 | 70,634,475 | 54.0 |
| | <u>පිරිවැය</u> | | | | |
| iii. | ටිකට්පත් මුද්‍රණ වියදම | 402,322,679 | 387,696,730 | 14,625,949 | 3.8 |
| iv. | ත්‍යාග වියදම | 8,296,413,110 | 7,263,436,665 | 1,032,976,445 | 14.2 |
| v. | දිනුම් ඇදීමේ වියදම | 575,478,468 | 466,033,872 | 109,444,596 | 23.5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| vi. | බෙදාහැරීමේ වියදම | 3,950,410,156 | 3,541,283,837 | 409,126,319 | 11.6 |
| - | ප්‍රචාරණ පිරිවැය | 391,624,924 | 386,284,208 | 5,340,716 | 1.4 |
| - | අලෙවිකරණ ආශ්‍රිත පිරිවැය | 15,160,049 | 225,475 | 14,934,574 | 6623 |
| - | විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 441,709,412 | 448,616,423 | (6,907,011) | (1.5) |
| - | අලෙවි නියෝජිත කොමිස් | 2,898,871,342 | 2,529,189,690 | 369,681,652 | 14.6 |
| - | බෙදාහැරීමේ කොමිස් | 203,044,429 | 176,968,041 | 26,076,388 | 14.7 |
| vii. | පරිපාලන වියදම් | 463,619,071 | 419,811,037 | 43,808,034 | 10.4 |
| - | සේවක පාරිශ්‍රමික වියදම් | 275,574,584 | 250,832,151 | 24,742,433 | 9.86 |
| - | මෘදුකාංග නඩත්තු වියදම් | 12,419,486 | 11,623,676 | 795,810 | 6.8 |
| - | වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණ දීමනා | 27,347,709 | 21,519,065 | 5,828,644 | 27.1 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ටිකට්පත් විකුණුම් ආදායම රු.1,873,355,940 කින් හෙවත් සියයට 13.4 කින් වර්ධනය වී තිබුණි. මෙම තත්ත්වයට හේතු වී තිබුණේ ලොතරැයි වර්ග 07 ක අලෙවි ආදායම සියයට 0.3 සිට සියයට 50.9 අතර පරාසයකින් අඩුවී තිබුණද අද කෝටිපති ලොතරැයියේ පමණක් අලෙවි ආදායම රු.2,937,269,200 කින් හෙවත් සියයට 197 කින් වැඩිවී තිබීම විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේකෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ වෙනත් ආදායම් රු.70,634,475 කින් හෙවත් සියයට 54 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආයෝජිත පොලී ආදායමේ රු.65,144,796 ක හෙවත් සියයට 72 ක වර්ධනයක් පැවතීම එම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වීතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සැසඳීමේදී ටිකට්පත් වියදමේ රු.14,625,949 ක හෙවත් සියයට 3.8 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. මෙම වැඩි වීමට අද කෝටිපති ලොතරැයියේ ටිකට්පත් වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.62,527,136 කින් හෙවත් සියයට 161 කින් වැඩි වීමද තවත් ටිකට්පත් 08 ක ටිකට්පත් වියදම සියයට 0.8 සිට සියයට 54.6 දක්වා අතර පරාසයකින් අඩු වීමද හේතු වී තිබුණි.

(ඈ) ටිකට්පත් 06 ක ත්‍යාග වියදමේ අඩුවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 6.6 ත් සියයට 50.5 ත් අතර පරාසයක විහිදී තිබුණි. එහෙත් අද කෝටිපති ලොතරැයියේ අලෙවිය සියයට 197 ක වර්ධනයට සපේක්ෂව ත්‍යාග වියදමද රු.1,468,634,600 කින් හෙවත් සියයට 197 කින් වැඩි වී තිබීම නිසා මුළු ටිකට්පත් ත්‍යාග වියදම රු.1,032,976,445 ක් හෙවත් සියයට 14.2 කින් වැඩි වී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දිනුම් ඇදීමේ පිරිවැය රු.109,444,596 කින් හෙවත් සියයට 23.51 කින් වැඩි වී තිබුණු අතර එම වැඩිවීම සඳහා අද කෝටිපති ලොතරැයියේ දිනුම් ඇදීම් වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.96,832,211 කින් හෙවත් සියයට 212.6 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ බෙදාහැරීම් පිරිවැය රු.409,126,319 කින් හෙවත් සියයට 11.6 කින් වැඩිවී තිබුණි. එම වැඩි වීමට ප්‍රචාරණ පිරිවැයේ සියයට 1.4 ක හෙවත් රු.5,340,716 ක වැඩි වීමද අලෙවිකරණය ආශ්‍රිත පිරිවැයේ සියයට 6623 ක හෙවත් රු.14,934,573 ක වැඩිවීමද අලෙවි නියෝජිත කොමිස් සියයට 14.6 කින් හෙවත් රු.369,681,652 ක වැඩිවීම හා බෙදාහැරීම් කොමිස් වියදම සියයට 14.7 කින් හෙවත් රු.26,076,388 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පරිපාලන වියදම සියයට 10.4 කින් හෙවත් රු.43,808,034 කින් වැඩි වී තිබුණි. මෙම වැඩි වූ ප්‍රමාණයෙන් රු.24,742,433 කින් සේවක පාරිශ්‍රමික වියදම නියෝජනය වන අතර එහි වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 9.80 කි. ඊට අමතරව පරිපාලන වියදමේ වැඩිවීමට මෘදුකාංග නඩත්තු වියදමේ රු.795,810 ක් හෙවත් සියයට 6.8 ක වැඩිවීමද වෛද්‍ය වියදම් හා රෝහල් ගාස්තු දීමනා වියදමේ සියයට 27.1 හෙවත් රු.5,828,644 ක වැඩිවීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

-------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | **2018** | **2017** |
|---|---|---|
| | -------- | -------- |
| **<u>මෙහෙයුම්</u>** | **සියයට** | **සියයට** |
| විකුණුම් ආදායමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 25 | 25 |
| විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය | 58 | 58 |
| **<u>ලාභදායීත්ව අනුපාත</u>** | | |
| දළ ලාභ අනුපාතය | 42 | 42 |
| ශුද්ධ ලාභ අනුපාතය | 14 | 3.6 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අනුපාතය මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස | 89 | 89 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය | 17 | 59 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය | 25 | 358 |
| **<u>ද්‍රවශීලතා අනුපාතය</u>** | | |
| ජංගම අනුපාතය | 1:1.37 | 1:1.7 |
| ක්ෂණික අනුපාතය | 1:1.31 | 1:1.8 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කරනු ලබන විකුණුම් හා බෙදාහැරීමේ වියදම්, විකුණුම් මිලෙන් සියයට 25 ක් ලෙස සමාන අගයක් ගෙන තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අනුපාතය මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 89 ක ඉහළ අගයක් ගෙන තිබුණි. මෙසේ අධික පිරිවැයක් දැරීම මණ්ඩලය ලබන ශුද්ධ ලාභයට සෘජුව බලපාන අතර එය ජනාධිපති අරමුදලට සිදුකරන දායකත්වයටද අහිතකර ලෙස බලපා ඇති බැව් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති ශුද්ධ ලාභය සියයට 17 ක්ම නියෝජනය කර ඇත්තේ පාරිභෝගික ජනතාවට ලබාදිය යුතු ත්‍යාග ආපසු පවරා ගැනීම මඟිනි. මෙම ප්‍රතිශතය ඉකුත් වර්ෂයේදී සියයට 59 ක වැඩි අගයක් පෙන්නුම් කර තිබීමටත් ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය

සියයට 25 සිට 358 දක්වා ඉහළ අගයක් ගෙන තිබීමටත් හේතුවී තිබුණේ ඉකුත් වර්ෂයේ හිඟ ආදායම් බදු වියදමක් එකවර දරා තිබීම බව නිරීක්ෂණය විය.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.1,873,355,940 ක් එනම් සියයට 13 කින් වැඩි වී තිබීමට සාපේක්ෂව විකුණුම් පිරිවැය රු.1,157,046,990 කින් එනම් සියයට 14 කින් වර්ධනය වීම දළ ලාභ අනුපාතය සියයට 42 ක ඒකාකාරී මට්ටමක පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාත පිළිවෙලින් 1.7 හා 1.37 ක අගයක් විය. ඒ අනුව මණ්ඩලයේ ජංගම වත්කම් අනුපාතය ප්‍රශස්ථ මට්ටමෙන් පවතින බවක් නිරීක්ෂණය නොවන හෙයින් සමාලෝචිත වර්ෂයේදී ද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

## 3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 3.1 අනාර්ථික ගණුදෙනු
------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 2018 වර්ෂය තුළ පැවැත්වූ අලෙවි නියෝජිත රැස්වීම් 11 ක් සඳහා සත්‍ය වශයෙන් සහභාගී වූ සංඛ්‍යාව 2346 ක් වූ නමුත් 2639 ක් වෙනුවෙන් දිවා ආහාරය සැපයීම සඳහා හෝටල් සඳහා රු.6,001,820 ක් ගෙවීම් කර තිබීම හේතුවෙන් 293 ක් වෙනුවෙන් රු.593,670 ක අතිරේක පිරිවැය දරා තිබුණි. | සාමාජිකයාගේ පවුලේ අයද සහභාගී වන බැවින් අමතර පිරිවැයක් දැරීමට සිදුවීම. | නිෂ්චිත වූ ප්‍රතිපත්තියක් ස්ථාපිත කල යුතු වීම. |
| (ආ) | අලෙවි නියෝජිත රැස්වීම් සඳහා සහභාගී වන්නන්ට බෙදාහැරීම සඳහා භාණ්ඩ ලබාගැනීම වෙනුවෙන් රු.2,625,000 ක මුදලක් අනුමත වී තිබුණත් රු.2,969,780 ක පිරිවැයක් දරා තිබීම නිසා රු.344,780 ක අමතර පිරිවැයක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. | සත්‍ය මිල ගණන් මණ්ඩලය ඇස්තමේන්තු කල වටිනාකමට වඩා වැඩි අගයක් බව | තාත්වික වූ පදනමක් මත ඇස්තමේන්තු සකස් කල යුතුය. |
| (ඇ) | සුදුසුකම් ලත් ගණකාධිකාරිවරයෙකු සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් මණ්ඩලය තුල සිටියදී මණ්ඩලය විසින් 2017 හා 2018 වර්ෂයන්ට අදාළ ආදායම් බදු, එකතුකල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා උපයන විට ගෙවීම් බදු ගණනය කිරීම සඳහා පෞද්ගලික ආයතනයක සේවය ලබාගැනීම වෙනුවෙන් රු.1,095,000 ක වියදමක් දරා තිබුණි. | 2017 සැප්තැම්බර් 26 වැනි දින පැවති කළමනාකරණ රැස්වීමේදී බදු උපදේශක සේවාව ලබාගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. | ආදායම් බදු ගණනයට ආයතනය තුලින් නිෂ්චිත ප්‍රතිපත්තියක් නිර්මාණය කල යුතුය. |

**3.2** හඳුනාගත් පාඩු

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිටපු සභාපතිවරයෙකු විසින් නියෝජිත සමාගමකින් භාරගෙන තිබුණු වටිනාකම රු.8,095,000 ක් වූ ඩබල් කැබ් රථය මණ්ඩලයේ නමට ලියාපදිංචි කර තිබුණු නමුත් මණ්ඩලය විසින් මුදල් නොගෙවීම මත මණ්ඩලයට විරුද්ධව නඩු පවරා තිබුණි. මෙම නඩුවේ තීන්දුව 2018 නොවැම්බර් 26 දින ලබාදුන් අතර වැය වූ මුළු වියදම රු.2,349,185 ක් විය. ඒ අනුව වාහනයේ වටිනාකමට හා නෛතික පොලිය ලෙස නියෝජිත සාමාගම වෙත රු.16,190,000 ක් ගෙවීමට සිදුවී තිබුණි. තවද, මෙම වාහනය මණ්ඩලයේ කිසිඳු මෙහෙයුම් කටයුත්තකට දායක කර නොගත්තද ක්ෂය වියදම ලෙස රු.8,095,000 ක් ලාභයට එරෙහිව කපාහැර තිබුණි. ඒ අනුව මෙකී වාහනය වෙනුවෙන් මණ්ඩලයට දැරීමටට සිදුවූ මුළු අලාභය රු.26,634,185 ක් වී තිබුණි. එම හේතුව නිසා මණ්ඩල පනතේ 11 (1) (අ) වගන්තිය අනුව ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු දායකත්වය රු.26,634,185 කින් අඩු වී තිබූ බැව් විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. | මෙම රථය මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබූ බැවින් අදාළ ක්ෂය ප්‍රතිපාදන සිදුකර ඇත. | මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබූ බැවින් වාහනයේ වටිනාකම අදාල ආයතනයට ගෙවීම් කර නොතිබීම මත මෙම මුදල හා නෛතික පොලියද ගෙවීමට සිදු වී ඇත. එබැවින් වත්කම් කළමනාකරණය පිළිබඳ ඉහළ කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතු බව |
| (ආ) | අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රදර්ශන රථ ලෙස ලියාපදිංචි නොකරන ලද වාහන භාවිතා කලයුතු වුවත්, කෝටිපති ශනිදා අවුරුද්ද විශේෂ ලොතරැයිය සඳහා දිනකට රු.2500 ක කුලිය මත වැගන් ආර් රථ 15 ක්ද, හා ශනිදා වාසනා New Year Dream විශේෂ ලොතරැයිය සඳහා දිනකට රු.5000 ක් ගෙවීමේ පදනම මත Honda Vezel රථයක්ද ලබාගෙන තිබුණි. වාහන 16 ක් සඳහා කුලී ලෙස රු.645,900 ක් ගෙවීම් කර තිබුණි. තවද, එකී ප්‍රදර්ශන කාලසීමාව තුල වාහනයේ වගකීම හිමිකරු දරා ගත යුතු වුවද Honda Vezel රථය අනතුරකට පත්වීම හේතුවෙන් රු.80,900 ක අලාභයක් සිදුවී තිබුණි. අවිධිමත් ලෙස ලබාගෙන තිබූ මෙම රථයේ අනතුර පිළිබඳව කිසිඳු පරීක්ෂණයක් කිරීමකින් තොරව මණ්ඩලය විසින් මෙම වියදම දරා ඇති බව නිරීක්ෂණය විය | එකඟ වේ. ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇති නොවීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රචාරණ රථ ලෙස ලියාපදිංචි නොකල වාහන භාවිතා කල යුතු අතර, විනිවිදභාවයකින් කටයුතු කල යුතු වීම. අනතුරු සිදුවූ ආකාරය පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදුකර සිදුවූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) ලොතරැයිපත්වල දිනුම් සඳහා ත්‍යාග ලෙස ලබාදීමට මිලදී ගන්නා ලද රු.4,035,160 ක් වටිනා මෝටර් රථ 2 ක් හා රු.219,500 ක් වූ යතුරු පැදියක් අලෙවි නියෝජිතයින්ගේ ඉල්ලීම මත ප්‍රදර්ශනය සඳහා ලබාදී තිබූ අතර එම යතුරුපැදිය හා මෝටර් රථ 02 අනතුරුවලට ලක්වී තිබුණි. මෝටර් රථ 2 අනතුරුවලට ලක්වීම මත රු.228,855 ක අලාභයක් සිදුවී තිබුණු අතර යතුරුපැදියේ අලාභය 2019 මැයි 15 වන විගණන දින වන විටත් තක්සේරු කර නොතිබුණි. ත්‍යාග සඳහා ලබාදීමට තිබූ මෙම වාහනවලට ප්‍රදර්ශන කාලය තුල මෙවැනි අනතුරක් සිදු වූ විට එම අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් විසින් මණ්ඩලය හා රක්ෂණ ආයතනය දැනුවත් කළ යුතු අතර නියෝජිතයින් විසින් ඒ සඳහා වගකිව යුතු විය. නමුත් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා අලාභය රක්ෂණ ආයතනයෙන් හෝ වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකිරීමකින් තොරව මණ්ඩලය විසින් මෙම අලාභය දරා තිබුණි. | එකඟ වේ. ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇති නොවීමට කටයුතු කරනු ලැබේ. | වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) විගණනයට ඉදිරිපත් වූ කරුණු අනුව 2013 අගෝස්තු 17 දින රු.411,500 කට මිලදී ගන්නා ලද ත්‍රීරෝද රථයක් (චැසි අංක XMD2A25B2XDWC71820X) අලෙවි නියෝජිතයකුගේ ඉල්ලීම පිට ප්‍රදර්ශන රථයක් ලෙස ලබාදීමට විකුණුම් අංශය විසින් කටයුතු කර තිබුණි. 2015 දෙසැම්බර් 28 දින ලබාදී තිබුණු මෙම රථය 2017 නොවැම්බර් 29 දින මණ්ඩලයට නැවතත් භාරදී තිබුණි. එහෙත් එය ලියාපදිංචි නොකල එකක් වන අතර එම රථය භාරදෙන අවස්ථාව වන විට ධාවනය කල නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. මණ්ඩලය වෙත භාරදී මාස 18 ක් ගතවී ඇතත් ඒ පිළිබඳ කිසිඳු පියවරක් නොගෙන තවදුරටත් දිරාපත්ව යනසේ පරිශ්‍රය තුල තබා තිබුණි. | මෙම ත්‍රී රෝද රථය විකුණා ජනාධිපති අරමුදල සඳහා මුදල් ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන අමාත්‍යාංශ අනුමැතිය සඳහා යොමුකර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු අවශ්‍ය කටයුතු සිදුකිරීමට සූදානම්ව ඇත. | ලියාපදිංචි නොකල වාහනයක් බැවින් අපහරණය කිරීමට ගැටළුකාරී තත්ත්වයක් මතුවන බැවින් වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගෙන අලාභය අයකර ගත යුතු වීම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

- ජනාධිපති අරමුදලට මුදල් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ ඒ සඳහා කටයුතු කිරීම.
- එසේ ලැබෙන මුදල් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් වෙළඳපොලට හඳුන්වාදී ඇති ටිකට්පත් 10 න් 07 කම ආදායම් 2017 වර්ෂයට සාපේක්ෂව පහත වැටී තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. 2017 වර්ෂයේ මෙම ටිකට්පත් හතේ විකුණුම් ආදායම රු.9,525,778,900 ක් වූ අතර 2018 වර්ෂයේ එම ආදායම රු.8,253,932,700 දක්වා රු.1,271,846,200 කින් පහත වැටී තිබුණි. ඒ අනුව මෙම ටිකට්පත් හතේ විකුණුම් ආදායම සියයට 0.3 සිට සියයට 50.9 දක්වා පරාසයක් තුල පහත වැටී තිබූ බව නිරීක්ෂණය විය. | අලෙවිය අඩු ලොතරැයි දිනුම් ඇදීමේ දින ගණන අඩුකර තිබීම මේ සඳහා බලපා ඇත. | විධිමත් අලෙවි උපක්‍රම භාවිතා කර අලෙවිය වැඩිකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) මණ්ඩලයේ ටිකට්පත් 6 ක බදුවලට පෙර ලාභය 2017 වර්ෂයට සාපේක්ෂව පහත වැටී තිබූ බව නිරීක්ෂණය විය. මෙම ටිකට්පත් හයේ 2017 වර්ෂයේ බදු පෙර ලාභය රු.1,491,511,027 ක් වූ අතර 2018 වර්ෂයේ බදුපෙර ලාභය රු.1,281,674,846 ක් විය. මේ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව බදුපෙර ලාභය රු.209,836,181 කින් පහත වැටී තිබූ අතර එය ටිකට්පත් අතර සියයට 5.1 ත් සියයට 60.9 ත් අතර පරාසයක විහිදී තිබුණි. | ඉහත හේතු නිසා බදු පෙර ලාභයද අඩුවී ඇති බව සඳහන් කර ඇත. | අලෙවි ප්‍රවර්ධන ක්‍රම තුලින් ලාභය වැඩිකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජයෝදා හා නියතජය ටිකට්පත් දෙකෙහි ප්‍රචාරණ වියදම පිළිවෙලින් සියයට 16.4 කින් හා සියයට 64.1 කින් වැඩි වුවද ඒවායේ විකුණුම් ආදායම පිළිවෙලින් සියයට 0.3 කින් හා සියයට 10.2 කින් පහත වැටී තිබුණි. තවද ග්ලැක්සි ස්ටාර් ටිකට්පතේ ප්‍රචාරණ වියදම සියයට 8.7 කින් පහළ බසින විට විකුණුම් ආදායම සියයට 50 කින් අඩුවී තිබුණි. එසේම සංවර්ධන වාසනාවේ හා ක්ෂණික ටිකට්පත්වල ප්‍රචාරණ වියදම සියයට 85.7 කින් හා සියයට 38.8 කින් වැඩිවන විට විකුණුම් ආදායම වැඩිවී තිබුණේ පිළිවෙලින් සියයට 12.5 කින් හා සියයට 3 කින් පමණි. | 2017 වර්ෂයේදී ප්‍රචාරණය සඳහා අඩුවෙන් අවධානය යොමුකිරීම නිසා 2018 දී එය වැඩිවී ඇති බව. | කාර්ය සාධනය ඉලක්ක කර පාලන ක්‍රම ස්ථාපිත කිරීම. |
| (ඈ) 2018 වර්ෂයේදී වෙළඳපොල පර්යේෂණ සඳහා විෂයය අංක 16-0006 යටතේ රු.මිලියන 2.5 ක මුදලක් වෙන්කර තිබූ අතර සංශෝධිත ඇස්තමේන්තුව මඟින් එම ප්‍රතිපාදන මුදල තවත් රු.50,000 කින් වැඩි කරගෙන තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේදී වෙළඳපොළ පර්යේෂණ කටයුතු සිදුකර නොතිබූ අතර මිලියන 2.55 ක ප්‍රතිපාදන මුදල වර්ෂ අවසානයේ සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | ඡේදය හා එකඟ වන බව. | සපුරා ගත හැකි ඉලක්ක ඇතුලත් කර අයවැය පිළියෙල කල යුතුවීම. |

| | | |
|---|---|---|
| (ඉ) 2018 වර්ෂයේ අයවැය මගින් රු.මිලියන 25 ක් වෙන්කරගෙන ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ Modern Lottery Shops 25 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | යෝජිත ස්ථාන අලෙවි නියෝජිතයින් සතුව නොපැවතීම හා ලැබෙන ප්‍රතිලාභ අපේක්ෂිත මට්ටමට ලඟා නොවීම. | සපුරා ගත හැකි ඉලක්ක ඇතුලත් කර අයවැය පිළියෙල කළ යුතු වීම. |
| (ඊ) අලෙවි නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරී සඳහා පෞද්ගලික වාහනය යොදාගැනීම වෙනුවෙන් කි.මී. එකකට රු.40 ක දීමනාවක් ගෙවනු ලැබුවද යොදාගනු ලබන වාහනය පිළිබඳ විස්තර ඇතුළත් ලිපිගොනුවක් මණ්ඩලය තුල නොතිබුණු අතර වාහන අංකය පමණක් මණ්ඩලය සතුව තිබුණි. පෞද්ගලික වාහන යොදවාගෙන රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.2,623,260 ක දීමනාවක් ගෙවා තිබුණද මණ්ඩලය වෙත දැනුම් දුන් වාහනය රාජකාරිය සඳහා යොදාගන්නේද යන්න හා රු.40 ක දීමනාව තීරණය කලේ කුමන වර්ගයේ වාහන සඳහාද යන්න නිශ්චිතව සඳහන් කර නොතිබුණු බැවින් දරන ලද වියදම්වල නිවැරදිතාව විගණනයේදී ගැටළු සහගත විය. | ඡේදය හා එකඟ වන බව. | නිෂ්චිත වූ ක්‍රමවේදයකට අනුව වියදම් දැරිය යුතු වීම. |
| (උ) 2018 වර්ෂයේ මුළු ටිකට්පත් මුද්‍රණ වියදම රු.326,382,842 ක් වූ අතර නොවිකිණි ඉතිරිවූ ටිකට්පත්වල මුද්‍රණ වියදම රු.37,169,426 ක් විය. ඒ අනුව ඉතිරි ටිකට් පත්වල මුද්‍රණ වියදම, මුළු වියදමෙන් සියයට 11.34 ක් විය. ප්‍රවර්ථන වර්ෂයේදී රු.20,850,283 අනාර්ථික වියදමක් දැරීමට සිදුව තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | දින 30 කට පෙර ඇණවුම් කිරීම, ලොතරැයි ටිකට්පත් අලෙවි නොකිරීම, වර්ෂාව නිසා සේවයට වාර්තා නොකිරීම යන හේතුන් මත විකුණා ගැනීමට නොහැකි වුවද නොවිකුණු ටිකට්පත් සියයට 5 ක මට්ටමේ රඳවාගැනීම සඳහා හා ක්ෂේත්‍ර අලෙවි බලකාය බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරු දැනුවත් කර ඇති බව වාර්තා කර ඇත. | ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පිළිවෙත් ස්ථාපිත කල යුතු වීම. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් 2018 අප්‍රේල් 05 දින සිදුකරන ලද වාහන අපහරණ ක්‍රියාවලියට ටෙන්ඩර් ලියවිලි නිකුත් කිරීමේදී ලබාගත් තැන්පතු මුදල් වන රු.160,500 ක් හා වාහන 2 අපහරණයෙන් | පුවත්පත් දැන්වීම් ප්‍රකාරව පරිපාලන නිලධාරියා කටයුතු කර ඇති බව | මුදල් සම්බන්ධව ඵලදායී අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කල යුතු වීම. |

| | | |
|---|---|---|
| ලැබුණු රු.5,400,000 ක මුදල සමඟ මුළු මුදල වන රු.5,560,500 ක් පරිපාලන නිලධාරි වෙත පුද්ගලිකව ගෙවා තිබුණු අතර පසුව ඔහුගේ අත්සනින් යුතුව බැංකු ගත කර තිබුණි. ඒ අනුව මණ්ඩලයේ මුදල් නිලධාරීන් අත හුවමාරු වීම පිළිබඳව ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන ගනුදෙනුවක් විය. | | |
| (ආ) අලෙවි ප්‍රවර්ධන සහකාර හා අලෙවි සම්බන්ධීකාරක යන ක්ෂේත්‍ර නිලධාරීන් 30 දෙනෙකු විවිධ සුදුසුකම් හා විවිධ වැටුප් තල යටතේ බඳවාගැනීම් කර තිබුණද ඔවුන් ඉටුකරනුයේ එකම ස්වභාවයේ රාජකාරීන් විය. එම එකම රාජකාරිය සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.10,680,829 ක් ගෙවා තිබුණි. | එකම රාජකාරියක් සිදුකලද ඔවුන්ගේ වගකීම, අධීක්ෂණ කටයුතු එකිනෙකට වෙනස් බව. | ක්ෂේත්‍රයේ පවතින අධීක්ෂණ මට්ටම හා සංවිධාන ව්‍යුහය අනුව තක්සේරුකල රාජකාරී පැවරීම සිදුකල යුතු බව. |
| (ඇ) කෝටිපති ශනිදා අවුරුද්ද විශේෂ ලොතරැයිපත් අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශන ත්‍යාග ප්‍රදර්ශන රථ ලෙස ලියාපදිංචි නොකරන ලද වාහන ප්‍රදර්ශනය කල යුතු වුවත් කුලී පදනම මත පැරණි වාහන 15 ක් යොදාගෙන තිබුණු අතර ඒ සඳහා 2018 මාර්තු 20 දින සිට අප්‍රේල් 10 දින දක්වා දිනකට රු.1500, රු.2000, රු.2200 හා රු.2500 යන විවිධ කුලී ගණන් යටතේ විධිමත් අනුමැතියකින් තොරව ප්‍රදර්ශන රථ ලෙස භාවිතා කර ඒ සඳහා රු.645,900 ක් කුලී ලෙස ගෙවීම් කර තිබුණි. ත්‍යාගලාභීන් නොමඟ යවන ලෙස පැරණි වාහන ප්‍රදර්ශනය සඳහා යොදාගැනීම මතභේදයට තුඩුදෙන ගනුදෙනුවක් විය. | සැපයුම්කාර සමාගමේ ප්‍රදර්ශනය සඳහා අතිරේක රථ තොග නොමැති බැවින් ලියාපදිංචි කරන ලද වැගන් ආර් රථ යොදාගත් බව | ත්‍යාග සම්බන්ධ අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම. |
| (ඈ) කෝටිපති අවුරුද්ද විශේෂ දිනුම් ඇදීමේ ලොතරැයිය පැවැත්වීම සඳහා 2018 මාර්තු 13 වන දා පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක 2018/03/1247 න් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා තිබුණද ඒ සඳහා අනුමැතිය ලැබී තිබුණේ 2018 මැයි 10 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදීය. නමුත් ලොතරැයි වැඩසටහන 2018 අප්‍රේල් 10 වන දින දියත් කර තිබුණි. ඒ අනුව විධිමත් අනුමැතියක් ලැබීමෙන් තොරව මෙම විශේෂ දිනුම් ඇදීම දියත් කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය. | අදහස් දක්වා නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසුව කටයුතු කිරීම. |
| (ඉ) දිනුම් අදිනු ලබන අවස්ථාවේදී විකුණූ ලොතරැයිපත් ලෙස සැලකූ වටිනාකම රු.5,559,820 ක් දිනුම් ඇදීමෙන් පසු නොවිකිණි ආපසු එවන ලද ලොතරැයිපත් ලෙස | විකුණුම් ආපසු එවීමට හේතුව තෙල්දෙණිය ප්‍රදේශයේ හදිසියේ සිදුවූ අයහපත් වාතාවරණය හා | • දැනට නඩත්තු නොකරන පොදු ජර්නලය නඩත්තු කිරීමට පාලන |

| | | |
|---|---|---|
| එම වටිනාකම විකුණුම් වටිනාකමින් අඩුකර පෙන්වා තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන ගණුදෙනුවක් විය. | වියදම් විෂයයන්වල වටිනාකම් වෙනස් වී ඇත්තේ ගණනය කිරීමේ දෝෂයක් වීම බව | ක්‍රමයක් හඳුන්වා දීම.<br>• දිනුම් ඇදීමේ වැඩසටහන් නිවැරදිව ක්‍රියාත්මක කිරීම.<br>• මූල්‍ය වාර්තා හා මාසික වාර්තාවල වෙනස්කම් සඳහා සැසඳුම් වාර්තා ඉදිරිපත් කිරීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ධාවන කල හැකි තත්ත්වයේ පවතින රු.2,720,587 ක් වටිනා යතුරුපැදි 16 ක් වසර 01ත් 03 ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන ගබඩාවේ ගාල්කර තිබුණි. 2017 වර්ෂයේ රු.233,000 කට මිලදී ගන්නා ලද 2018 ජනවාරි වන විට කිලෝමීටර් 25,000 කට ආසන්න ප්‍රමාණයක් ධාවනය කර ඇති යතුරු පැදියක්ද මෙහි ඇතුළත් වේ. අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් බඳවා ගත් පසු ඔවුන්ට මෙම යතුරුපැදි ලබාදෙන බවට දැනුම් දී තිබුණද ඔවුන්ට ලබාදීම සඳහා රු.1,631,400 ක් වටිනා යතුරු පැදි 6 ක් 2019 මාර්තු 19 දින මිලදී ගෙන තිබුණි**.** | යතුරු පැදි 16 ක් අපහරණය කිරීමට අනුමැතියට ලිපියක් මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.<br><br>කි.මී.25,000 ක ධාවනය කල යතුරු පැදිය ධාවනයට නුසුදුසු බව දක්වා ඇත. යතුරු පැදි එකක් බඳවාගැනීමට නියමිත අලෙවි ප්‍රවර්ධන සහකාරට ලබාදීමට නියමිතය. | අවශ්‍යතාවය නිසිපරිදි ඇස්තමේන්තු කර නිසි පරිපාටීන්වලට අනුව වත්කම් ප්‍රසම්පාදනය කර ගැනීම. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ප්‍රසම්පාදන ප්‍රමාදයන්**<br>ටිකට්පත් ප්‍රවාහනය සඳහා කෘ කැබ් රථ මිලදී ගැනීම වෙනුවෙන් 2018 පෙබරවාරි 19 දින මිල ගණන් විවෘත කර මාර්තු 15 දින රු.5,565,000 කට ඇණවුම් කරන ලද වාහනය, 2018 ජුනි 13 දින ප්‍රචාරණ රථයක් ලෙස නිර්මාණය කිරීමට සැලසුමකින් තොරව කටයුතු කර තිබුණි. තවද ඒ සඳහා රු.1,990,000 ක වියදම් | කෘ කැබ් රථ දෙක ටිකට්පත් ප්‍රවාහනය වෙනුවෙන් මිලදී ගනු ලැබූ නමුත් එක් රථයක් අලෙවි ප්‍රචාරණ රථයක් ලෙස | අයවැය සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2018 සැප්තැම්බර් 25 දින සිට මෙය කාර්ය ආරම්භ කර තිබුණද 2019 මැයි 15 දින වන විටත් එය සිදුකර නොතිබුණි. | පරිවර්තනය කිරීමට කළමනාකාරීත්වය අදහස් කරනු ලැබේ. ඒ අනුව ප්‍රචාරණ රථය නිර්මාණය කිරීම අදියර 02 ක් යටතේ සිදුවේ. පළමු අදියරෙන් පිටුපස ආකෘතිය නිර්මාණය කිරීමද දෙවැනි අදියරයෙන් LED තිරය සහ ජෙනරේටරය මිලදී ගැනීමද සිදුවේ. එම නිසා යම් කාලසීමාවක් ගතවී ඇත. | |

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| | | |
|---|---|---|
| (i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4.2.1 ඡේදය ප්‍රකාරව සපයා ඇති ආකෘතිය අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කල යුතු වුවත් මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල ප්‍රසම්පාදන ක්‍රමය (Procument Method) කුමක්ද යන්න ඇතුළත් කර නොතිබුණි. | එකඟ නොවේ. ප්‍රසම්පාදන ක්‍රමය Bid Calling ලෙස දක්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන ක්‍රමය සඳහන් කල යුතුවීම. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ඡේදය අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් හඳුනාගත යුතු වුවද, මණ්ඩලයේ 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ වූ ප්‍රසම්පාදනයන් 14 ක් එනම්, රු.මිලියන 166.9 ට ආසන්න ප්‍රසම්පාදනයන් 2018 වර්ෂය තුළද ක්‍රියාත්මක වී නොතිබූ අතර ඊට පරිබාහිරව ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව, මණ්ඩලයේ කළමනාකාරීත්වය උපායමාර්ගිකව උපදේශ හා අරමුණු සැලකිල්ලට ගැනීමටත් ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා ගැනීමටත් අපොහොසත් වී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ ප්‍රසම්පාදනයන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත්, වෙළඳපොලෙහි රඳා පැවතීමටත් අනෙකුත් තරඟකාරී ආයතනවල ප්‍රවර්ධන වැඩසටහන් හේතුවෙන් මෙසේ සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියාකල යුතුවීම. |
| (iii) ප්‍රසම්පාදන සැලැස්ම අනුව කුඩ 30,000 ක් මිලදී ගැනිමට සැලසුම් කර තිබුණද 2018 වර්ෂය තුලදී කුඩ 37,800 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව අනුමත සීමාව ඉක්මවා වටිනාකම රු.2,950,428 ක් වූ කුඩ 7800 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය හා අවශ්‍යතාවය විගණනයට තහවුරු නොවීය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අවබෝධ කරගෙන මිලදී ගැනිම සිදුකල යුතු වීම. |

**ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීම රු.196,776,045**

| | | |
|---|---|---|
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (අ) ඡේදයේ I හෝ II විකල්පයන්ට අනුව ලංසු සුරක්ෂණ වටිනාකම ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකම වූ රු.196,776,045 හි ප්‍රතිශතයක් ලෙස තීරණය කල යුතුය. ඒ අනුව තීරණය කල යුතු මුදල රු.1,697,760 ක් වුවත් රු.4,378,000 ක් අයකිරීම හේතුවෙන් රු.2,680,240 ක වටිනාකමක් අදාළ ආයතනවලින් වැඩිපුර අයකර තිබුණි. ඒ පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් පත්කල ප්‍රසම්පාදන අස්ථිත්වයේද අවධානය යොමුවී නොතිබුණි. 2016/2017 වර්ෂවල ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීමේදී පැවති වසර 03 ක අත්දැකීම් පැවතිය යුතු බවට වූ නිර්ණායකයන් 2017/2018 වර්ෂවලට අදාළව වසරක පළපුරුද්දක් දක්වා අඩුකර තිබීමත් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකල යුතු මෙම ප්‍රසම්පාදනය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකිරීමත් නිසා ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීමේ ප්‍රසම්පාදනය විධිමත් පරිදි සිදුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව හා වසර 03 පළපුරුද්ද වෙනුවට වසරක පළපුරුද්ද ප්‍රමාණවත් බවට කොන්දේසි වෙනස් කිරීමට සිදුවූයේ නවතම අදහස් ඇති නිර්මාණාත්මක ආයතනවල දායකත්වය ලබාගැනීම සුදුසු බව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් තීරණය කර ඇති නිසා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් තීරණ ගත යුතුවීම. |
| (ii) ප්‍රචාරණ නියෝජිත ආයතනයක් තෝරාගැනීම සඳහා වූ 2016/2017 කාලපරිච්ඡේදයට අදාළ ප්‍රචාරණ ප්‍රසම්පාදන කටයුත්ත 2017 ජූලි 31 දින අවසන් වූ අතර 2017/2018 කාලපරිච්ඡේදයට අදාළ ප්‍රචාරණ ප්‍රසම්පාදන කටයුත්ත 2018 ජනවාරි 16 දින ආරම්භ වී ඇත. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරවූ මාස 05 ක කාලයක් සඳහා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රු.16,373,268 ක වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කාලසටහනට අනුව කටයුතු කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතුවීම. |
| (iii) වෙළඳ දැන්වීම් ප්‍රචාරණය සඳහා නියෝජිත ආයතන 04 ක් තෝරාගෙන තිබුණද ඉන් එක් ආයතනයක් නියතජය ලොතරැයියේ වෙළඳ දැන්වීම් නිර්මාණකරණය වෙනුවෙන් තෝරාගෙන ඇති අතර එම ආයතනයේ පිරිවැය අනෙකුත් ආයතන 03 ටම වඩා සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණු බව පිරිවැය ඇස්තමේන්තු සැසඳීමේ ප්‍රකාශය අනුව නිරීක්ෂණය විය. ඒ අනුව අවුරුදු 02 ක් පමණක් ව්‍යාපාර අත්දැකීම් ඇති අධික පිරිවැයක් සහිත ආයතනයක් එක් ලොතැරැයියක ප්‍රචාරණ නිර්මාණ කටයුතු වෙනුවෙන් පමණක් තෝරාගැනීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | ද්විත්ව කවර ක්‍රමයට අනුව නිර්මාණාත්මක යෝජනාවලින් පදනම් කරගනිමින් පමණක් වෙළඳ දැන්වීම් නියෝජිත ආයතන තෝරාගෙන ඇත. | එම |

**(ඈ) <u>ත්‍යාග මිලදී ගැනීම. (කෝටිපති ශනිදා) රු.27,300,000</u>**

| | | |
|---|---|---|
| (i) කෝටිපති ශනිදා ලොතරැයිය සඳහා ත්‍යාග ලෙස වැගන් ආර් රථ (Brand New) 05 ක් ලබාදීමට තීරණය කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 ඡේදය ප්‍රකාරව සෘජු ක්‍රමය යටතේ එහි නියෝජිත ආයතනය මගින් පමණක් මිල ගණන් විමසා මිලදී ගත යුතු වුවද, පුද්ගලික රියපොළ (Car Sale) මගින් මිල ගණන් කැඳවා භාවිතා කරන ලද (Recondition) වාහන 05 ක් රු.මිලියන 17.5 කට මිලදීගෙන තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 වන ඡේදය ප්‍රකාරව සෘජු ක්‍රමය යටතේ වූ මිලදිගැනීම් සඳහා ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ට ගෙවීම් කල නොහැකි වුවද, රු.18,000 ක් අදාළ කමිටු සාමාජිකයින්ට ගෙවා තිබුණි. | ටොයෝටා ලංකා එම මාදිලිය ආනයනය නොකරන අතර AMW තොග නොමැති බව දැක්වීම මත දේශීය ආනයනකරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඇත. කොන්ත්‍රාත් වටිනාකම සැලකිල්ලට ගෙන එකී සාමාජිකයින් වෙත ගෙවීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතු වීම. |
| (ii) කෝටිපති ශනිදා කෝටිපති අවුරුද්ද විශේෂ දිනුම් වාරය සඳහා රු.මිලියන 1.5 ක ගෘහ භාණ්ඩ කට්ටල ලබාදීමට තීරණය කරනු ලැබූ අවස්ථාවේදීම Damro යන සන්නම් නාමය සඳහන් කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) වගන්තිය අනුව සුදුසුකම්ලත් අනෙකුත් සැපයුම්කරුවන්ට සාධාරණ හා සමාන අවස්ථා ලබාදී නොතිබුණි. | ප්‍රසම්පාදන අයවැය සැකසීමේදී Damro ගෘහ භාණ්ඩවල මිල ඇස්තමේන්තු පදනම් කරගෙන ඇති නමුත් මිල ගණන් කැඳවීමේදී අනෙකුත් ආයතනවලින්ද මිල ගණන් කැඳවා ඇති බව | එම |

**(ඉ) <u>අලෙවි ප්‍රවර්ධන අයිතම් මිලදී ගැනීම රු.14,322,323</u>**

| | | |
|---|---|---|
| (i) අවස්ථා 03 කදී කුඩ 35,000 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබූ අතර එහි ලංසු ලේඛනයෙහි 17 වන කොන්දේසිය අනුව කොන්ත්‍රාත්තුව පිරිනැමූ දින සිට නියමිත කාලසීමාව තුලදී භාණ්ඩ භාරදිය යුතු අතර එසේ නොවුනහොත් ප්‍රමාද ගාස්තු අය කරන බැව් සඳහන් කර තිබුණි. ඒ අනුව නියමිත දිනට භාණ්ඩ නොලැබීම මත රු.418,260 ක දඩ මුදලක් අයකල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. දණ්ඩන මුදල් අයකරන බව දන්වා ඇත. | එම |
| (ii) 2018 ඔක්තෝබර් 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අවශ්‍ය වූ කුඩ ප්‍රමාණය 7500 ක් වුවද, කුඩ 20,000 ක් ඇණවුම් කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් කුඩ 11,900 ක් පමණක් ලැබී තිබුණි. ඉතිරි කුඩ 8100, 2019 අප්‍රේල් 11 දින වන විටත් මණ්ඩලය වෙත ලැබී නොතිබුණු අතර රු.2,541,151 ක් වටිනා කුඩ 6718 ක් 2018 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරිව තිබුණි. | එක් තරඟවාරයක් සම්පූර්ණයෙන් අලෙවි වීම මන්දගාමී අන්දමින් සිදුවීම මත 2018 දෙසැම්බර් 31 දින සියලු කුඩ වෙළඳපොලට නිකුත් කිරීමට නොහැකි වීමත් හා ක්ෂණික ලොතරැයිපත් උපායමාර්ගික ක්‍රමවේදයක් ඔස්සේ | සැලසුම් සකස් කර අවශ්‍යතාවයට පමණක් සරිලන ලෙස භාණ්ඩ මිලදී ගැනීම් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| | සිදුවීම නිසා අවස්ථානුකූලව මෙය වෙළඳපොලට නිකුත් කරන බව | |
| (iii) ටෙන්ඩර් කොන්දේසි අංක 15 අනුව, තෝරාගත් සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව පිරි නැමීමේ නිවේදනය නිකුත් කල දින සිට දින 10 ක් ඇතුළත අදාළ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක වටිනාකමක් සඳහා කාර්ය සාධන ඇපකරයක් ලබාදිය යුතුව තිබුණද රු.4,299,965 ක් වටිනා කුඩ 10,000 ක් වූ මුළු ඇණවුම් ප්‍රමාණයම 2018 ජූලි 10 දින මිලදී ගැනීමෙන් පසුව කාර්යසාධන ඇපකරය ලබාගෙන තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | වෙළඳපොල ඉල්ලුම සපුරාලීමේ අවශ්‍යතාවය මත යම් කුඩ ප්‍රමාණයක් කාර්ය සාධන ඇපකරය නොමැතිව ගබඩාව වෙත ගෙන්වා ගැනීමට සිදුවූ අතර කාර්යසාධන ඇපකරය මණ්ඩලය වෙත ලබාදීමට යම් කාලසීමාවක් ගතවී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතුවීම. |

**(ඊ) <u>කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය ලබාදීම රු.4,819,179</u>**

| | | |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන් බැහැරව කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය ලබාදීම වෙනුවෙන් සැපයුම්කරුවකු තෝරාගෙන තිබුණු අතර 2018 වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු.මිලියන 4.8 කට වැඩි මුදලක් ගෙවා තිබුණි. | මිල ගණන් කැඳවා සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීමට කටයුතු යොදන බව දක්වා ඇත. | එම |

**(උ) <u>Fork Lift එකක් මිලදී ගැනීම. රු.4,500,000</u>**

| | | |
|---|---|---|
| සංයුක්ත සැලැස්ම තුල දැක්වුනු බෙදාහැරීමේ කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීම සඳහා අයවැය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු Fork Lift යන්ත්‍රයක අවශ්‍යතාවය ප්‍රධාන ගබඩාව, උප ගබඩාව හෝ වෙනත් කිසිදු අංශයක් විසින් ඉල්ලුම් කර නොතිබුණි. තවද මෙම මිලදී ගැනීම ප්‍රසම්පාදන සැලසුම් අනුවද අනුමත කර නොතිබුණු නමුත් රු.4,500,000 ක් වැය දරා Toyota ලංකා ආයතනයෙන් 2018 ජූලි 02 දින එම යන්ත්‍රය මිලදීගෙන තිබුණි. තවද, පිරිවිතර නොගැලපීම, තාක්ෂණික උපදේශකගේ නිර්දේශ නොමැතිව හා මුදල් අමාත්‍යාංශය විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු නොමැතිව තාක්ෂණික ඇගයීම් සිදුකිරීම, මිලදී ගැනීමට සුදුසු අගයන් නිර්දේශ කර නොතිබීම, නිසි අනුමැතියකින් තොරව රු.25,000 ක වියදමක් දරා උපදේශක සේවාවක් ලබාගැනීම යනාදී ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මෙම කටයුත්ත සිදුකර තිබුණි. එසේම විගණනය විසින් සිදුකළ පරීක්ෂාවේදීද අනාවරණය වූයේ මෙවැනි යන්ත්‍රයක් උපයෝජනය කර ගැනීමට ගබඩාව තුල හා මණ්ඩලයේ පරිශ්‍රය තුල ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බවය. | - 2018 සංයුක්ත සැලැස්ම තුලින් හා මෙම වටිනාකම අයවැය ගතවී අනුමත වී ඇති නිසා කිසිදු අංශයක් විසින් ඉල්ලුම්කර නොමැති බව පැවසීම අසත්‍යය.<br>- ටොයෝටා ලංකා ආයතනය දේශීය නියෝජිත ආයතනයක් වන නිසා මෙම මිලදී ගැනීම ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත සිදුකර ඇත.<br>- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරියා සම්බන්ධ කරගත නොහැකි වීම | - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතුය.<br>- මුදල් අමාත්‍යාංශය විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධ කරගත යුතුය.<br>- කාර්යශ්‍රිත අංශ වලින් නිසි අවශ්‍යතාවය හඳුනාගත් පසු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා යොමුකර |

| | | |
|---|---|---|
| | නිසා වෙනත් උපදේශකයකුගේ සේවාව ලබාගත් බව<br>- තාක්ෂණික උපදේශකගේ වාර්තාව ලැබී ඇති බව<br>- උපදේශක විසින් ඉල්ලුම් කරන ලද රු.25,000 සඳහා කළමණාකාරීත්වය පසුව අනුමැතිය ලබාදුන් බව | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් ලෙස විධිමත් අනුමැතියක් ලබාගත යුතුවීම. |

**(ඌ කෘ කැබ් මිලදී ගැනීම. රු.12,555,000**

| | | |
|---|---|---|
| (i) අලෙවි ප්‍රවර්ධන රථය සඳහා සිදුකල ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී උපදේශකයකු මඟින් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාගෙන තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1 පරිච්ඡේදය අනුව අදාල ආයතනය තෝරාගැනීමට හේතුවූ කරුණු ඇතුලත් උපදේශකයාගේ වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මිල කියුම් ඇගයීම සඳහා උපදේශාත්මක සහය ලබාගෙන ඇත. නිර්දේශය ගොනුවේ පවතින බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකල යුතු වීම. |
| (ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8 (අ) අනුව විෂය පිළිබඳ විශේෂඥයකුගෙන් සහ ප්‍රසම්පාදන පරිපාටිය පිළිබඳ දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතුය. එහෙත් අලෙවි ප්‍රචාරණ රථයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුව එවැනි දැනුමක් සහිත සාමාජිකයෙකු නොමැති වීම නිසා අලෙවි ප්‍රචාරණ රථයක් නිර්මාණය කිරීමට සහ LED තිරය සහ ජෙනරේටරය මිලදී ගැනීමට සිදුවීමෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අකාර්යක්ෂම වී තිබුණි. | පිරිවිතර සකස් කිරීම හා ඇගයීම් වෙනුවෙන් අමතර තාක්ෂණික සහාය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හරහා ලබාගෙන ඇති අතර ඒ අනුව ලංසු කැඳවා ඇගැයීම් කටයුතු මේ වන විටත් සිදුවන බව | එම |

## 3.8 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයිති අක්කර 01 ක ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමට එකඟ වී තිබුණද විධිමත් පරිදි බදු ගිවිසුමකට එළඹීමකින් තොරව සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා එම ඉඩමේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.492,392 ක් මණ්ඩලය විසින් වැය කර තිබුණි. නමුත් එය සංචාරක නිවාසයක් ඉදිකිරීමට නුසුදුසු බැවින් යලි ඉඩම පවරා ගන්නා ලෙස 2018 සැප්තැම්බර් 13 දින තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් වෙත දක්වා තිබුණි. ඒ අනුව මේ සඳහා දරන ලද වියදම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකර තවදුරටත් වත්කමක් ලෙස පෙන්වා තිබුණි. | එකඟ වේ. ඉදිරියේදී ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ විධිවිධාන ප්‍රකාරව ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන විකුණුම් හා අලෙවි උපදේශක තනතුර සඳහා වයස අවුරුදු 64 ක් වූ එක් අයකුද, 2019 අප්‍රේල් 30 දින වන විට කාර්ය මණ්ඩල සාමාජිකයකු නොවන වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයකු ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී ලෙස කොන්ත්‍රාත් පදනම මත මාස 06 ක කාලසීමාවක් සඳහා තවත් 4 දෙනෙකුද සමඟ බඳවා ගෙන තිබුණි. ඉහත වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | උපදේශක සඳහා පමණක් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කලද අනුමැතිය ලැබී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව අදාළ අනුමැතීන් ලබාගැනීමෙන් පසු බඳවා ගැනීම් සිදුකළ යුතු බව. |
| (ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ 2006 අංක 30 විධිවිධාන අනුව 2015 දෙසැම්බර් 16 දින අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා ලිඛිත විභාගයකින් හෝ | ඕනෑම ආයතනයක සභාපතිවරයෙකු වෙත ස්වාධීනව රැකියා ඉල්ලුම් කරමින් අයදුම්පත් යොමු කල හැකි බැවින් එම පදනම මත බඳවාගැනීම් සිදුකර ඇති බව | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගත යුතු විය. එහෙත් 2018 ජනවාරි සිට ජූලි 30 දක්වා විවිධ තනතුරු 05 ක් සඳහා කාර්ය මණ්ඩලය 18 දෙනෙකු ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමකින් තොරව බඳවා ගැනීම් සිදුකර තිබුණි. | | |
| **(ඇ) <u>සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) බඳවා ගැනීම</u>** | | |
| (i) මෙම තනතුර සඳහා 2016 ලැබුණු අයදුම්පත් අතුරින් 27 ක්ද 2017 අයදුම්පත් 45 න් 21 ක්ද වශයෙන් අයදුම්කරුවන් 48 ක් 2018 පෙබරවාරි 15 හා 17 දිනයන්හි සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට 2018 පෙබරවාරි 12 දින කැඳවීම් ලිපි අත්සන් කර තිබුණි. ඒ අතුරින් සම්මුඛ පරීක්ෂණය සඳහා 24 දෙනෙකු සහභාගී වී නොතිබුණු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමට ප්‍රමාණවත් කාලසීමාවක් ලබාදී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | සම්මුඛ පරීක්ෂණ 2017 දෙසැම්බර් 15 හා 17 දිනයන්හි පවත්වා නොමැති අතර එය 2018 පෙබරවාරි 15 හා 17 දින පවත්වා ඇති බවත්, 24 දෙනෙකු සහභාගී නොවූයේ වෙනත් රැකියා ලැබීම, විදේශගත වීම, යන හේතූන් මත සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන බවට දූරකථනයෙන් දැනුම් දී ඇති බව. | විධිමත් ක්‍රමවේදයකට අනුව බඳවාගැනීම් සිදුකල යුතු වීම. |
| (ii) සම්මුඛ පරීක්ෂණ වාර්තා අනුව අදාළ සේවා පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 03 බැගින් වසර 10 ක් සඳහා ලකුණු 30 ක් ලබාදී තිබුණද, ඉහළ ලකුණු ලබා සිටි එක් අයදුම්කරුවෙකුට සේවා පළපුරුද්ද සඳහා ලකුණු ලබාදී ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබා නොදීමට හේතුවද සඳහන් කර නොතිබුණි. නමුත් තනතුර සඳහා තෝරාගත් අයදුම්කරුගේ සේවා කාලය සම්පූර්ණ කර ඇති බවට සාක්ෂි නොවූ අතර කාලය තහවුරු කිරීම සඳහා පෙර සේවා ස්ථානවලින් ඉදිරිපත් කර තිබූ ලිපිලේඛනවල නිවැරදිතාවයද තහවුරු කරගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි. | සම්මුඛ පරීක්ෂණය සිදුකරනු ලබන්නේ ජීව දත්තයේ ඇතුළත් තොරතුරු තහවුරු කරගනිමින් නිවැරදිතාවය පරීක්ෂා කිරීමට බව | මුල් පිටපත් අදාළ ආයතනවලින් නිකුත් කල ඒවාමද යන්න තහවුරු කිරීමක් කල යුතුය. සම්මුඛ පරීක්ෂණය විනිවිදභාවයකින් සිදුකල යුතු බව |
| **(ඈ ) <u>රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම</u>** | | |
| (i) රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමට 2018 ජූනි 14 දින හා 2018 ඔක්තෝබර් 19 දිනයන්හිදී අවස්ථා 2 කදී සම්මුඛ පරීක්ෂණ පවත්වා අට දෙනෙකු බඳවාගෙන තිබුණි. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එම අවස්ථා දෙකේදී අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම එකිනෙකට වෙනස් අයුරින් සිදුකර ඇති බව නිරීක්ෂණය විය. | අවස්ථා දෙකකදී අමාත්‍යාංශ නියෝජිතයින් දෙදෙනෙකු සහභාගී වී ඇති නිසා ඒ අනුව ලකුණු ලබාදීමේ නිර්ණායක වෙනස් වී ඇති බව. | ස්ථාවර වූ නිර්නායක ස්ථාපිත විය යුතුය. එය පුද්ගලයෙකු මත යැපිම අවශ්‍ය නැත. |

| | | |
|---|---|---|
| (ii) එසේ බඳවාගත් රියදුරන් 6 දෙනෙකුගේ අධ්‍යාපන සුදුසුකම් තහවුරු කරගැනීම සඳහා විභාග කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතික පත්‍රය ලබාදී නොතිබුණු අතර මණ්ඩලය විසින් එහි නිවැරදිතාවය තහවුරු කරගෙන නොතිබුණි. | විභාග කොමසාරිස් නිකුත් කරන ලද සහතික පත්‍රය පරීක්ෂා කරන්නේ බඳවාගැනීමෙන් පසු පරිවාස කාලය තුලදී බවත් බොහෝදුරට වසරක කාලයක් තුලදී නිරවද්‍යතාවය තහවුරු කරගනු ලබන බව. | සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් පරීක්ෂාවට ලක්කල යුතු වීම. |
| (iii) 2018 අගෝස්තු 20 දින පුවත්පත් දැන්වීම අනුව රියදුරු තනතුරු 03 ක් සඳහා අයදුම්පත් 320 ක් ලැබී තිබුණු අතර, ඉන් 29 ක් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තිබුණි. නමුත් බඳවා ගන්නා ලද අයදුම්කරුවන් තිදෙනෙකුගෙන් දෙදෙනෙකුගේම අයදුම්පත් සම්මුඛ පරීක්ෂණ දිනට පෙර ලැබී තිබුණු අයදුම්පත් බව නිරීක්ෂණය විය. | සභාපති වෙත ලියාපදිංචි තැපැල් මඟින් මහජනතාව රැකියා ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කල හැකි බව හා සම්මුඛ පරීක්ෂණය පවත්නා අවස්ථාවලදී එම අයදුම්පත්‍ර සලකා බලන බව. | විධිමත් වූ බඳවාගැනීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කල යුතු වීම. තවද 2015 දෙසැම්බර් 15 දින අනුමත කරන ලද බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය අනුව සියළු බඳවා ගැනීම් සිදුකළ යුතු බව. |

## 3.10 වාහන පද්ධතිය කළමනාකරණය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වාහන අපහරණය කිරීම** | | |
| (i) මණ්ඩලය විසින් අංක GJ-3934 හා අංක 65-3920 අංක දරන වාහනවල අළුත්වැඩියාවන් සඳහා අවම වශයෙන් ආයතන 03 කින් මිල ගණන් කැඳවීමකින් තොරව අදාල නියෝජිත ආයතන මඟින් පමණක් එක් ඇස්තමේන්තුවක් ලබාගෙන එය පදනම් කරගෙන අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බව සඳහන් කරමින් වාහන අපහරණය කිරීමට කටයුතු කර තිබුණි. | හිටපු සභාපතිවරයා විසින්, වාහන ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන බැවින් අපහරණය කිරීමට උපදෙස් දුන් නිසා අපහරණය කල බව | වත්කම්වල නඩත්තුව නිසි පරිදි පවත්වාගෙන යෑමට නව අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීම. |
| (ii) වාහන අපහරණය සඳහා ටෙන්ඩර් ලියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන රු.5000 ක තැන්පතුවක් හා ආපසු නොගෙවන රු.3000 ක තැන්පතුවක්ද බැගින් එකතුව රු.160,500 ක මුදලක් පරිපාලන නිලධාරී විසින් ඍජුවම ලබාගෙන පසුව බැංකුගත කර තිබුණි. අදාල රිසිට්පත්වල ගනුදෙනුකරුගේ නම, ජාතික | මුදල් තැන්පතු කල වේලාවන් පැහැදිලිව දැක්වෙන බවත් එක් රිසිට්පතක බැංකු ගත කළ වේලාව පමණක් ප්‍රමාදයක් පවතින බව | අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හැඳුනුම්පත් අංකය හා මුදල් ගෙවූ කාරණය යන කිසිදු තොරතුරක් ඇතුළත්ව නොතිබුණු අතර ටෙන්ඩර්පත් දැන්වීම අනුව 2018 අප්‍රේල් 05 දින ප.ව.1.00 දක්වා පමණක් අයදුම්පත් නිකුත් කරන බැව් සඳහන් කර තිබුණද අයදුම්පත් 07 ක් එම වේලාවෙන් පසුව නිකුත් කර තිබුණි. | | |
| (iii) | අංක WP65-3920දරන වාහනය සඳහා වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ මණ්ඩලයේ අලෙවි නියෝජිත ලෙස කටයුතු කරන දෙදෙනෙකු විසින් බව නිරීක්ෂණය විය. ඒ අනුව උපරිම මිල හා දෙවන උපරිම මිල ලෙස රු.3,650,000 හා රු.3,550,000 ක් ඉදිරිපත් වී තිබුණි. ඉන් රු.3,650,000 මිල ගණන් ඉදිරිපත් කල පුද්ගලයා වාහනය රැගෙන යෑමට නොපැමිණීම හේතුවෙන් දෙවන මිල ඉදිරිපත් කල එම ලිපිනයේම වූ අනෙක් ඉල්ලුම්කරු වෙත වාහනය රු.100,000 ක් අඩුවෙන් ලබාදී තිබූ බව වාර්තා වී තිබුණි. කෙසේ වුවද උපරිම මිල ඉදිරිපත් කර පසුවමිලදී ගැනීම ප්‍රතික්ෂේප කල අය පැමිණ වාහනය රැගෙන ගිය බැව් ආරක්ෂක අංශය විසින් වාර්තා කර තිබුණි. ඒ අනුව මණ්ඩලය සමඟ දෛනිකව කටයුතු කරන නියෝජිතයකු සමඟ සිදුකරන ලද මෙම ගණුදෙනුව පිළිබඳ විධිමත් සොයා බැලීමකින් තොරව මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් වාහනය ලබාදීම අනුමත කර තිබුණි. | පළමුව මිල ඉදිරිපත් කල පුද්ගලයා ප්‍රතික්ෂේප කර ඇති අතර වාහනය ලබාගත් පුද්ගලයා විසින් ලියකියවිලි භාරගෙන ඇත. දෙවනුව මිල ඉදිරිපත් කල පුද්ගලයා වාහනය ඇතුළුව සියලු උපාංග අත්සන් කර ලබාගෙන ඇති බවත් ඔහුගේ අභිමතය පරිදි වෙනත් අයෙකු වාහනය පදවාගෙන ගොස් ඇති බව. | විධිමත් ක්‍රමවේදයකට අනුව වාහන අපහරණය විනිවිදභාවයකින් සිදුවිය යුතු බව. |
| (iv) | අදාල වාහනය අලෙවි කර මාස 11 කට පසුව මිලදීගත් පුද්ගලයා නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබූ අවස්ථාවේදී 2003/2004 වර්ෂවල සුබෝපභෝගී බද්ද මණ්ඩලය විසින් ගෙවා නොමැති බැවින් එය ගෙවා රිසිට්පත් ඉදිරිපත් කරන ලෙස ඔහු විසින් 2019 ජනවාරි 26 දින මණ්ඩලය වෙත ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් 2019 මාර්තු 25 දින රු.7500 ක දඩ මුදලක් ගෙවා එම රිසිට් පතද වාහනය මිලදී ගැනිම, කලින් ප්‍රතික්ෂේප කල පුද්ගලයා වෙත භාරදී තිබුණි. | දඩ මුදල ගෙවන ලද රිසිට්පත ටෙන්ඩර්කරුගේ ඉල්ලීම මත සහෝදරයාට ලබාදී ඇති බව | විධිමත් ක්‍රමවේදයකට අනුව වාහන අපහරණය විනිවිදභාවයකින් සිදුවිය යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3. ඡේදයේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත්, මණ්ඩලය විසින් 2018 වර්ෂයට අදාළව සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉහත පරිදි ඉදිරිපත් කර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලය එය අනුමත කර තිබුණේ 2018 සැප්තැම්බර් 25 වන දින පැවති රැස්වීමේදීය. | නිරීක්ෂණය හා එකඟ වී ඇත. අදාළ අනුමැතියක් ලබාගැනීමට කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ජනවාරි 09 දිනැති PE/MD/NLB/MO/2018 දරන ලිපිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය සමඟ ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව දන්වා තිබුණද මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී අදාල සැලසුම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යවා ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවීම. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ජනවාරි 09 දිනැති අංක PE/MD/NLB/MO/2018 දරන ලිපිය මඟින් ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධන වාර්තාව හා මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පිළිබඳ කාර්තුමය වාර්තා, කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුළත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු බව දක්වා තිබුණද මණ්ඩලයේ කළමනාකාරීත්වය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ මුල් කාර්තුවේ කාර්ය සාධන ඇගයීම මුදල් අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉලක්ක ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ඇස්තමේන්තු ගත ප්‍රමාණයන් හා පිරිවැයන්, අදාළ කාලවකවානු ද අයවැය ප්‍රතිපාදනයන් ද ඇතුළත් වන පරිදි 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක්ද හඳුන්වා දී නොතිබුණි. | 2019 වර්ෂයේදී ක්‍රියාත්මක වනු ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීමට සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |
| (ඇ) මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය එකිනෙකට සමගාමීව පිළියෙල කර නොතිබුණි. | සංයුක්ත හා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. | එකිනෙකට සමගාමී වන ලෙස පිළියෙල කල යුතු වීම. |
| (ඇ) මණ්ඩලයේ ප්‍රචාරණ සැලැස්මට අනුව පළමු කාර්තුවේදී වාර්ෂික ප්‍රවර්ධන දින දර්ශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමුකර අනුමැතිය අපේක්ෂාවෙන් සිටින බව. | විධිමත් අනුමැතීන් මත කටයුතු කල යුතු බව |

## 4.3 අයවැය පාලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන යහපාලන මැයෙන් වූ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය පරිදි අයවැය ලේඛනය තුළ අයවැය ගත ශේෂ පත්‍රයද ඇතුළත් විය යුතු වුවත් මණ්ඩලයේ සංශෝධිත අයවැය තුළ අයවැය ගත ශේෂ පත්‍රය ඇතුළත් කර නොතිබුණි. | 2019 අයවැය ලේඛනය තුල නිවැරදි කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ප්‍රකාශය පිළියෙල කල යුතු වීම. |
| (ආ) 2017 හා 2018 වර්ෂයේදී ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට ඒ ඒ වර්ෂවල රු.මිලියන 30 ක අයවැය ප්‍රතිපාදන සිදුකළද මෙතෙක් ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ඒකාබද්ධ ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව. | ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඇ) 2018 වර්ෂය තුළ අලෙවි නියෝජිත රැස්වීම් 11 ක් පැවැත්වීම වෙනුවෙන් රු.6,250,000 ක මුදලක් අයවැය මඟින් වෙන්කර තිබුණු නමුත් එම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත රු.2,400,000 ක අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම මණ්ඩලයට සිදුවී තිබුණි. ඒ අනුව | වැඩිපුර ගෙවීම් කර ඇති වියදම් සඳහා අදාල අනුමැතිය ලබාගෙන ගෙවීම් සිදුකර ඇති බව. | තාත්වික වූ අයවැයන් පිළියෙල කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අනුමත වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.8,650,000 ක් වුවත් මෙම රැස්වීම් ප්‍රමාණය පැවැත්වීම සඳහා රු.10,979,490 ක් වැයකර තිබුණි. ඒ අනුව රු.2,329,490 ක අමතර වියදමක් දරා ඇති බව විගණනයේදී නිරික්ෂණය විය. | | |
| (ඇ) | 2017 අයවැය ඇස්තමේන්තු හරහා අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා රථයක් නිර්මාණය කිරීම වෙනුවෙන් රු.මිලියන 10.2 ක ප්‍රතිපාදන තිබියදී ටිකට්පත් ප්‍රවාහනය සඳහා මිලදී ගැනීමට සැලසුම් කර තිබුණු කෘ කැබ් රථ 2 න් එක් රථයක් අලෙවි ප්‍රවර්ධන රථයක් බවට පත්කිරීමට මණ්ඩලය විසින් සැලසුමකින් තොරව කටයුතු කර තිබීමෙන් රු.5,565,000 ක ප්‍රාග්ධනයක් නිශ්කාර්ය ලෙස පැවතීමක් විගණනයට නිරීක්ෂණය විය. | ලොතරැයිපත් ගම් මට්ටමට ගෙනයාම සඳහා උපායමාර්ගයන් ලෙස මෙම වාහනය ප්‍රචාරණ රථයක් ලෙස සකස් කර යෙදවීමට පරිවර්තනය කිරීමේ කාර්යය සිදුකරමින් සිටින බව. | කාර්යයන් සැලසුම් සහගතව සිදුකල යුතු වීම. |
| (ඉ) | 2018 වර්ෂයේ ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීම වෙනුවෙන් සංශෝධිත අයවැය තුල රු.196,776,045 ක වටිනාකමක්ද ප්‍රසම්පාදන සැලැස්ම තුල රු.100,000,000 ක වටිනාකමක්ද වෙන්කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිරව අයවැය ප්‍රතිපාදන සිදුකර ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අයවැය හා ප්‍රසම්පාදන සැලැස්මේ වටිනාකම් තාත්වික විය යුතු වීම. |
| (ඊ) | මණ්ඩලයේ වැය විෂය 09 කට අදාලව සිදුකර තිබූ ප්‍රතිපාදන මුදල හා සත්‍ය වියදම පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ එම වැය විෂයන්ට අදාළව සියයට 67 ත් 99 ත් අතර පරාසයක මුදල් ඉතිරිවී තිබුණු බවයි. ඒ අනුව මෙයින් පැහැදිලි වන්නේ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව මෙම වැය විෂයන් සඳහා වියදම නිසි පරිදි පුරෝකථනය කිරීමට අපොහොසත් වී ඇති බව සහ එම නිසා ආයතනයට අයවැය ලේඛනය පාලන උපක්‍රමයක් ලෙස යොදා ගැනීමට නොහැකි වී තිබුණු බවයි. | අයවැය ලේඛනය, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම ආදිය කාර්තු වශයෙන් ඇගැයීමට ලක්කර ඵලදායී මෙවලමක් ලෙස යොදාගැනීමට අවධානය යොමුකර ඇති බව. | නිශ්චිත වූ අයවැය ලේඛනමය පාලන උපක්‍රමයක් ඇති කල යුතු වීම. |
| (උ) | අවශ්‍යතාව හඳුනාගැනීමෙන් තොරව අයවැය ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වූ ප්‍රතිපාදනවලින් සියයට 60 ක්ම ඌණ උපයෝජිතව පැවතුණි. | 2019 දී නිවැරදි කරන බව සඳහන් කර ඇත. | තාත්වික වූ අයවැයක් පිළියෙල කල යුතු වීම. |

**4.4 පාරිසරික ගැටලු හා සමාජ වගකීම ඉටු කිරීම**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ලොතරැයි දිනුම් ඇදීමේදී ක්‍රියාත්මකවන අධීක්ෂණ ක්‍රියාවලිය** | | |
| (i) | මුද්‍රා තබන ලද ස්ටිකර් සහිත පන්දු මලු විවෘත කිරීමේදී හා ඒවා නැවත මුද්‍රා තිබීමේදී අධීක්ෂණ නිලධාරියා සමඟ මණ්ඩලයේ වගකිවයුතු සමාන මට්ටමේ තනතුරු දරන මාණ්ඩලික හෝ විධායක නිලධාරියෙකු ස්ටිකර් මත අත්සන් නොතැබීම. | කණිෂ්ඨ කළමනාකරුවන් එම කාර්යයට සුදුසු බව, | විගණන නිරීක්ෂණය තුලින් පෙන්වාදී ඇති ආකාරයට පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතු වීම. |
| (ii) | දිනුම් ඇදීමේ වාරය ආරම්භවීමට පෙර මුද්‍රණය කල ටිකට්පත් ප්‍රමාණය, අලෙවිය හා ඉතිරිය පිළිබඳ තොරතුරු ඇතුළත් දිනුම් ඇදීමේ වාර්තාවේ සහතික පිටපත් අධීක්ෂණ විගණන නිලධාරී වෙත ඉදිරිපත් නොකිරීම. | අධීක්ෂණ විගණන නිලධාරීව ඉදිරිපත් කරනවා වෙනුවට සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කරන බව, | එම |
| (iii) | දිනුම් ඇදීමේ වැඩසටහන විකාශනය අවසානයේ විගණන අධීක්ෂණ නිලධාරී ඉදිරියේ පන්දු සහිත මලු මුද්‍රා තබන අවස්ථාවේදී මුද්‍ර තැබීමේ රාජකාරිය ආරම්භ කිරීමට පෙර අධීක්ෂණ මණ්ඩලයේ සිටි සෙසු සාමාජිකයන් දෙදෙනා අධීක්ෂණ රාජකාරියෙන් නිදහස් කිරීම. | අධීක්ෂණ මණ්ඩලය තුල සිදුවන විගණනයේ අධීක්ෂණය, අධීක්ෂණ මණ්ඩලයේ සෙසු සාමාජිකයින්ගේ අධීක්ෂණයට ලක්වීම අවශ්‍ය නොවන බැවින් එම දෙදෙනා අධීක්ෂණ කාර්යයන් නිදහස් කරන බව, | එම |
| (iv) | දිනුම් ඇදීමේ අවස්ථාවෙන් පසුව, එම අවස්ථාවේදීම අවසාන ප්‍රතිඵල වාර්තාවේ පිටපතක් අධීක්ෂණ විගණන නිලධාරී වෙත ලබාදීමේ ක්‍රමයක් නොතිබීම. | නිල ප්‍රතිඵලය රහස්‍ය තොරතුරක් නිසා අධීක්ෂණ විගණන නිලධාරියාට පසුව පිටපතක් ලබා දෙන බව, | එම |
| **(ආ)** | **<u>දිනුම් ඇදීමේ ත්‍යාග ප්‍රතිඵලයේ විශ්වාසදායීභාවය</u>** | | |
| **(i)** | දිනුම් ඇදීමේදී විකුණුම් ලෙස සැලකූ වටිනාකම රු.5,559,820 ක් වූ විකුණු ටිකට්පත්, දිනුම් ඇදීමෙන් පසු නොවිකිණි ආපසු එවූ ටිකට්පත් ලෙස සලකා තිබීම. | 2018/03 මාසයේ තෙල්දෙණිය ප්‍රදේශයේ සිදුවූ අයහපත් වාතාවරණය මෙයට හේතු වූ බව | විධිමත් වූ දිනුම් ඇදීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මණ්ඩලය විසින් ධාවනය කර අලාභ හානි සිදුවීමෙන් අනතුරුව අළුත්වැඩියා කරන ලද එකතුව රු.4,254,660 ක් වූ යතුරු පැදියක් හා කාර් රථ 02 ක් අද කෝටිපති, දශ ලක්ෂපති හා සුපර්බෝල් යන ලොතරැයිවල ත්‍යාග වශයෙන් ලබාදී තිබුණි. | ඉදිරියේදී මෙවැනි කටයුතු සිදුනොවීමට කටයුතු යොදන බව | ත්‍යාග ලබාදීමේ ක්‍රියාවලිය විධිමත් කල යුතුය.<br><br>අලාභ හානි සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගත යුතු බව |